

# Erectile Dysfunction

## ලිංගික අප්‍රාණිකත්වය

**(Impotence)**



**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre




ලිංගික අප්‍රාණිකත්වය යනු පුරුෂයින්ගේ දක්නට ලැබෙන තම සහකාරිය සමඟ ලිංගිකව එක්වීම සඳහා ප්‍රමාණවත් ලෙස පුරුෂ ලිංගේන්ද්‍රිය ප්‍රාණවත් නොවීමෙන් ඇතිවන රෝග ලක්‍ෂණයයි. මෙය රෝග ලක්‍ෂණයක් මිස රෝගයක් නොවන අතර එය වෙනත් කායික හෝ මානසික හෝ එම දෙවර්ගයේ සංකලනයකින් ඇතිවන රෝගයක රෝග ලක්‍ෂණයකි.

කලාතුරකින් මෙම තත්වය නිරෝගී පුද්ගලයකුට වුවද ඇතිවිය හැකි අතර බොහෝවිට අධික මත්පැන් පානය විඩාව හෝ මානසික ආතතිය (Anxiety/stress) වැනි තත්වයකදී ඇතිවිය හැක. එවැනි කලාතුරකින් ඇතිවන ලිංගික අප්‍රානිකත්වය එතරම් සැලකිය යුතු නොවන අතර එය දිගින් දිගටම පවතින්නේ නම් වෛද්‍යවරයෙකු හමු වී පරීක්‍ෂා කරවා ගත යුතුය.

### ලිංගික අප්‍රාණිකත්වය සඳහා හේතු සාධක කවරේද ?

බොහෝවිට ලිංගික අප්‍රානිකත්වය සඳහා හේතුව Anxiety / Depression වැනි මානසික ආබාධයක් ලෙස කලින් සැලකුවද නවතම සොයා ගැනීම් අනුව එයට හේතුව බොහෝවිට කායික රෝගී තත්වයක් ලෙස හඳුනාගෙන ඇත.

බොහෝ විට මෙලෙස කායික රෝගී තත්වයක් නිසා බොහෝ විට ඇතිවන ලිංගික අප්‍රානිකත්වය මාස කීපයක් හෝ වසර කිහිපයක් තිස්සේ ක්‍රමාණකූලව වර්ධනය වන තත්වයක් වේ.

විශේෂයෙන් උදෑසන අවදිවන විට ස්වයංක්‍රීයව ලිංගේන්ද්‍රයේ ප්‍රාණවත් බවක් දක්නට ලැබේනම් (Morning Erection) බොහෝ විට කායික රෝගී තත්වයක් නොමැති බවට අනුමාන කළ හැක.

පහත සඳහන් හේතු නිසා ලිංගික අප්‍රානිකත්වය ඇතිවිය හැකිය.

**01. කායික රෝගී තත්වයක් නිසා**

ලිංගේන්ද්‍රයේ ප්‍රාණවත් වීම සඳහා එයට මනා රුධිර සැපයුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ. එලෙස ලිංගේන්ද්‍රයට රුධිර සැපයුම අඩාල වීමට හේතුකාරක වන සමහර රෝගී තත්වයන් නිසා එය හටගත හැක.
උදා: දියවැඩියාව, අධික රුධිර පීඩනය, අධික කොලෙස්ටරෝල් මට්ටම, දුම් පානය, තරබාරු බව ආදිය.

**02. මානසික රෝගී තත්වයක් නිසා**

හීනෝන්මාදය (Depression) හා මානසික ආතතිය (Anxiety) වැනි රෝග තත්ව මෙන්ම එදිනෙදා ජීවිතයේදී ඇතිවන ගැටළු නිසාද ලිංගික අප්‍රානිකත්වය ඇතිවිය හැකිය.

උදාහරණ වශයෙන් තම සහකාරිය සමඟ ඇතිවන ආරවුල්, වැඩපලේ හෝ එදිනෙදා ජීවිතයේ ඇතිවන ගැටළු, ආර්ථික ගැටළු, නීතිමය ප්‍රශ්න ආදිය නිසා ඇතිවන මානසික ආතතිය (stress)

**03. කායික හා මානසික හේතුවල සංකලනයක් ලෙස**

**04. හේතුවක් සොයාගැනීමට අපහසු කාරණා නිසා (Unknown Causes)**

**05. සමහර ඖෂධ, මත්ද්‍රව්‍ය භාවිතය ආදියේ අතුරු ප්‍රතිවිපාක ලෙස**

### රෝග නිර්ණය කරගන්නේ කෙසේද

බොහෝවිට පිරිමි උදවිය මෙය රෝග ලක්‍ෂණයක් ලෙස සලකා වෛද්‍යවරයෙකු හමුවී ප්‍රතිකාර ඉල්ලා සිටින අවස්ථා සුලභය. නමුත් සමහර උදවිය ලැජ්ජාව, සමාජ පසුබිම ආදී විවිධ හේතුසාධක නිසා රෝගය පැවතුනද වෛද්‍යවරයෙකු හමු වී එයට ප්‍රතිකාර පැතීමට මැලිකමක් දක්වන ස්වභාවයක්ද පවතී.

නමුත් ලිංගික අප්‍රානිකත්වය තවත් බරපතල රෝගයක (දියවැඩියාව, හෘද රෝග ආදිය) රෝග ලක්‍ෂණයක් විය හැකි නිසා ඔබටත් එය පවතීනම් වෛද්‍යවරයෙකු හමුවී ප්‍රතිකාර ලබාගැන්ම ඉතා වැදගත්ය.

රුධිර පරීක්‍ෂණ, රුධිර පීඩනය මැනීම වැනි ක්‍රම මගින් ඉහත කී රෝග ඇතිදැයි පරීක්‍ෂා කරන අතර සමහර විට පුරුෂ හෝමෝන ඌණතාවයක් පවතීද යන්න පරීක්‍ෂා කිරීමට රුධිර පරීක්‍ෂණ සිදු කරනු ලැබේ.
විශේෂයෙන් ලිංගික අප්‍රානිකත්වයට හේතුව කායික රෝගයක් ද එසේ නැතිනම් මානසික හේතුවක්ද යන්න සැක හැර දැනගැනීම ඊට නිසි ප්‍රතිකාර තීරණය කිරීම සඳමා මහත් සේ උපකාරී වේ.

### මේ සඳහා ඇති ප්‍රතිකාර මොනවාද?

මේ සඳහා පහත සඳහන් පරිදි විවිධ ප්‍රතිකාර ක්‍රම භාවිතා කරනු ලැබේ.

01. Psychotherapy and counseling මානසික හේතු සඳහා

02. ඖෂධමය ප්‍රතිකාර (Oral tablets)
උදා: Viagra, Cialis වැනි පෙති වර්ග

03. External Vaccum pumps - පුරුෂ ලිංගේන්ද්‍රියට රුධිර සැපයුම වැඩි කිරීම සඳහා භාවිතා කරන ක්‍රමයකි.

04. ලිංගේන්ද්‍රියට එන්නත් වර්ග ලබා දීම
උදා: Caverject impulse

05. Penile Prosthetic Implants

06. හෝමෝනමය ප්‍රතිකාර

07. ඉතා කලාතුරකින් ශල්‍යකර්ම

ප්‍රතිකාරවල පළමු අදියර වන්නේ ලිංගික අප්‍රානිකත්වයට හේතුවන යම් පසුබිම් රෝගයක් ඇතිනම් එය හඳුනාගෙන එයට ප්‍රතිකාර කිරීමයි.

ඊට සමගාමීව බොහෝ විට පෙති වර්ග වැනි සරළ ප්‍රතිකාර පළමුව නිර්දේශ කර ඒවාට යහපත් ප්‍රතිචාරයක් නොදක්වයි නම් එන්නත් Implant වැනි ප්‍රතිකාර ක්‍රමවලට යොමුවීම සිදුවේ.

එලෙසම මෙයට හේතුව වෙනත් ඖෂධ වර්ග මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය ආදියේ අතුරු ප්‍රතිවිපාකයක් ලෙස නම් එවැනි ද්‍රව්‍ය භාවිතා කිරීම නැවැත්වීමට අදාල පියවර ගැනීම සිදු කරනු ලැබේ.

### ඖෂධමය ප්‍රතිකාර පිළිබඳ වැඩිදුර විස්තර

ලිංගික අප්‍රානිකත්වය සඳහා ඇති ප්‍රතිකාර ක්‍රම අතරින් වඩාත්ම සුලභව භාවිතා කරන එසේම වඩාත්ම ජනප්‍රිය හා වඩාත්ම පහසු ප්‍රතිකාර ක්‍රමය වන්නේ පෙති වර්ග (Tablets) මගින් ප්‍රතිකාර ක්‍රමයයි.

මෙලෙස භාවිතා කරන පෙතිවර්ග පොදුවේ (PDE - 5 i - hibitors) ලෙස හඳුන්වන අතර වාණිජමය නම් වශයෙන් ගතහොත් ඕස්ට්‍රේලියාවේ භාවිතා කරන ප්‍රධාන පෙති වර්ග 03ක් ඇත.
Viagra
Cialis
Levitra

මෙම පෙතිවර්ග ලිංගික අප්‍රානිකත්වය ඇති පිරිමින්ගෙන් 70% ට පමණ යහපත් ප්‍රතිපල උදා කරදීමට සමත්ය.

මෙම පෙති ලිංගික කර්තව්‍යයට පැයකට පමණ පෙර පාවිච්චි කළ යුතු අතර සමහර විට අධික මේද සහිත ආහාර, අධික මත්පැන් භාවිතය වැනි හේතු නිසා, ඒවා ශරීරයට උරා ගැනීම අඩපන විය හැකිය.

බොහෝ විට මෙම පෙති වර්ගවල අතුරු ආබාද ලෙස හිසරදය, හෘද ස්පන්ධනය වේගවත් වීම, නාසයේ ඇතිවන බරගතිය, සබාසට්ැඑසදබ වැනි ආහාර දිරවීම ආඩාල වීම වැනි තාවකාලික අතුරු ආබාද පෙන්නුම් කරයි.

ඉහත සඳහන් කළ පෙතිවර්ග තුනෙහිම මූලික ක්‍රියාකාරිත්වය සමාන වුවද ඒවා ශරීරය තුල ක්‍රියා කරන කාලය එකිනෙකට වෙනස් වේ. උදාහරණයක් ලෙස ඩ්ස්ටර් නැමැති ඖෂධය පැය 8 - 10 ක් වැනි කෙටි කාලයක් ශරීරය තුල (උපරිමව) සක්‍රීය වන අතර ඣස්කසි නැමැති ඖෂධය පැය 18 - 36 ක් අතර කාලයක් ක්‍රියාකාරීව පැවතිය හැකිය.